Page 2 March 2011.qxd 21/03/2011 22:45 Page 1




# ලංකාවිත්ති
LANKA VITHTHI




LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

*Phone* : 02074289388
*Fax* : 08719005163
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

## ක්‍රිකට් පිස්සුව නරක නැත!

ක්‍රීඩාවට පමණක් නොව වෙනත් ඕනෑම දෙයකට දක්වන තද ඇල්ම ගණන් ගනු ලබන්නේ පිස්සුවක් ලෙසිනි. ලෝක ක්‍රිකට් ශූරතාවේ සත්කාරක රටක්ද වන ශ්‍රීලංකාව ඒ ආසියාකරයේ අනෙක් සත්කාරක රටවල් වන ඉන්දියාව පකිස්ථානය සහ බංගලාදේශය මෙන් ම මේ දවස්වල ක්‍රිකට් උන්මාදයෙන් වෙලී සිටින්නීය. ලෝක ශූරතාවක් තිබුණත් නැතත් හැමදාම වාගේ ක්‍රිකට් කෙරෙහි මෙම රටවල් දක්වන අසීමිත උනන්දුව කොතරම්ද යත් එයින් තොර ජීවිතයක් ඔවුන්ට නැති තරම් ය. ඒ තත්වය ඉදිරි කාලයේදී හෝ වෙනස් වන බවක් නැත.

ඉංග්‍රීසි අධිරාජ්‍යයේ යටත් විජිතව තිබූ හැමරටකම පාහේ ඒ ඉංග්‍රීසින්ගේ ක්‍රීඩාව මුල් බැසගත් සැටි අපි කවුරුත් දනිමු. අතීතයේ කොළඹ ඕවල් ක්‍රීඩාංගනය පමණක් ක්‍රිකට් සඳහා නම් දැරූ පිටියක් වුවද අද ගාල්ල, මාතර, මහනුවර, දඹුල්ල පමණක් නොව හම්බන්තොට පවා ඉඩම්වල ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් පිට්ටනි ඉදිවී ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ පැවැත්වෙන සැටි අපි අද දකිමු.

ක්‍රීඩාවක් වශයෙන් ක්‍රිකට් අනෙක් ක්‍රීඩාවන්ට වඩා හොඳද නරකද? එයින් අප රටට වැඩක් ඇත් ද? එය අත හැර පාපන්දු අප රටට වඩාත් හුරු කළ යුතුද? රටේ දැවෙන ප්‍රශ්න කොතෙකුත් තිබියදී අපේ ජනතාව සහ රටකරවන අය ක්‍රිකට් පසුපස එළවිය යුතුද? එයින් කරන්නේ රටේ ප්‍රශ්න රටවැසියාට අමතක කරවීම නොවේද? ආදී වශයෙන් දේවල් සිතීම පසෙකට ලා මා මෙතෙක් දැක පුරුදු ක්‍රිකට් සහ අපේ ක්‍රීඩා ලෝලීත්වය ගැන කරුණක් දෙකක් මෙහි ලියනු කැමැත්තෙමි.

ක්‍රිකට් ක්‍රීඩාව නිසා අප රටට කීර්තියක්ද ගෞරවයක් ද ප්‍රසිද්ධියක් ද මෑත කාලයේ ලැබුණු බව පිළිගත යුතු සත්‍යයකි. ඒ ක්‍රීඩාව නිසා අප රට කෙරෙහි විදේශිකයන්ගේ අවධානය යොමුවූ බව පැහැදිලි ය. එංගලන්තයේ වසන අපි මෙය නොයෙක්වර අත්දැක ඇත්තෙමු. ලංකාවෙන් යයි කියූ පමණින් ඔවුන් අසන්නේ අරවින්ද, සනත්, මුරලි ආදී අපේ ක්‍රීඩක පෞරුෂයන් ගැන ය. ආසියානු ජනයා කෙරෙහි දක්වන අකමැත්තක් බටහිර ජාතීන් අතර තිබුණේ නම් ඒ අකමැත්ත සෑහෙන පමණකට වියැකී යන්නට අප රටේ ක්‍රීඩකයින්ගේ ක්‍රිකට් කෞශල්‍යය හා ජයග්‍රහණ ඉවහල් වූ බව අපි හොඳාකාරවම දනිමු.

ක්‍රිකට් පෙන්නා ජනතාවට ප්‍රශ්න අමතක කරවනවායි නැගෙන ඇතැම් චෝදනාවන් හි යම් පමණක සත්‍යයක් ද ඇත. අවුරුදු 30 ක් පුරා පැවති කුරිරු යුද්ධ කාලයේ දුක් සෝක සුසුම් කඳුළු මැද අප රටේ ජනතාව කිසියම් අස්වැසිල්ලක් ලැබූයේ අපේ ක්‍රිකට් කණ්ඩායම විදේශ පිළක් හා තරඟ වැදී ඒ විදේශිකයන් පරාජයකරනු දැකීමෙනි. දරුණු යුද්ධයක් යන අතරවාරයේ ශ්‍රීලංකා පිළ අවසාන තරඟයට තේරී පකිස්ථානයේ ලාහෝර් හි ගඩාෆි ක්‍රීඩාංගනයේදී 1996 මාර්තු 17 වන දින ඕස්ට්‍රේලියාව පරාජය කරමින් ක්‍රිකට් ලෝක ශූරතාව දිනූ මොහොතේ අපට යුද්ධය ද සියළු කරදර ද අතුරු ආන්තරා ද මුළුමනින් අමතක විය. ක්‍රිකට් පිත්තේ මා දකින ආශ්චර්යය එයයි.

# දකින්න බැරි නිවන



බොහෝ බෞද්ධයන් පින් කරන්නෙ යම් දිනක නිවන් දකින්නත් හිතාගෙනයි. එහෙම හිතන්නෙ නිවන කියන්නෙ මොකක්ද කියලවත් හරිහැටි නොදනයි. ඒ වගෙම නිවන කියන්නෙ තමා තුළම තියෙන ධර්මයක් මිසක, තමාගෙන් පිටත තියෙන බාහිර ධර්මයක් නොවන බවත් නොදනයි. එම නිවන සාක්ෂාත් වෙන ධර්මයක් මිසක දකින්න පුළුවන් ධර්මයක් නොවෙයි. නිවන එසේ සාක්ෂාත් වෙන්නෙ නිවන තමා බවටත්, තමා නිවන බවටත් පත් වෙලයි. එහෙම වෙන්නෙ නිවන තමන්ට පත්තියං වෙලයි. නිවන එසේ පත්තියං වෙන්නෙ ඉතාමත්ම සංවේදී පුද්ගලයන්ට පමණක් බවයි පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි කියන ධර්ම පාඨයෙ අදහස.

අප කන-බොන ආහාර-පාන අපට පත්තියං උනාම ඒවායේ ආහාර ස්වරූපය වෙනස් වෙලා ඒවා අප නොහොත්, අපේ ලේ බවට පත් වෙනවා වගෙයි නිවනත් අපට පත්තියං වෙන්නෙ. ඒ උනාට නිවන එසේ පත්තියං උනාම මමය මාගේය කියන හැඟීම ගෙනදෙන සක්කාය දිට්ඨියයි කියන මතය නමැති පිළිගැනීමත් නැතිවෙල සදාතන නිවන පමණක් ඉතිරි වෙනවා. විශුද්ධි මාර්ගය ලියන බුද්ධඝෝෂ හාමුදුරුවො අත්ථි නිබ්බුති න නිබ්බුතො කියල, නිවනක් තිබුණට නිවන් දැක්ක කෙනෙක් දකින්න නැහැ කියන්නෙ ඒකයි. ඊට හේතුව මමය, මාගේය කියන හැඟීම ගෙනදෙන සක්කාය දිට්ඨිය නිවන් මගේ ස්ථිර මුල් පියවර වන සෝවාන් පලයෙදිම නැතිවීමයි. ඊට පස්සෙ නිවන් දකින මාර්ගයක් තිබුණට, ඒ මාර්ගයේ ගමන් කරන කෙනෙකු දක්නට නැති බවයි මග්ගමත්ථි ගමිකො න විජ්ජති කියා බුද්ධඝෝෂ හිමියන් වදාරන්නෙ. ඒ නිසයි සක්කාය දිට්ඨිය නැති වීමෙන් පසු, යළි නොවරදින ලෙස ඇරඹෙන එම මාර්ගය අවසානයෙදි නිවන් දකින කෙනෙකුත් නැති වෙන්නෙ.

මමය මාගේය කිය හැකි කෙනෙක් ඉන්නව කියන හැඟීම තියාගෙන කවදාක්වත් නිවන් දකින්න බැහැ. බුදු දහමෙන් කියවෙන පරම සත්‍යය අනුව, මමය මාගේය කියා කෙනෙක් ඇත යන්න මායාකාර මතයක් පමණයි. ඇත්ත වශයෙන්ම මම යනු හැම ක්ෂණයකදීම වෙනස් වෙවී යන ගතික ශක්ති ප්‍රවාහයක් පමණයි.

කිසිම අවස්ථා දෙකකදි ඒ අනිත්‍ය ශක්ති ප්‍රවාහයට එකම ස්වරූපයකින් ඉන්න බැහැ. බාහිරව එහි පෙනෙන ස්ථාවර ස්වරූපය මායාවක් පමණයි. භෞතික වශයෙන් පොඩි කාලෙ හිටිය අපම නොවෙයි දනුත් ඉන්නෙ. බුදු හිමියනුත් බුදු වීමෙන් පසු ගතවුණු අවුරුදු 45 තුළ එකම භෞතික ස්වරූපයෙන් හිටියෙ නැහැ. උන්වහන්සෙත් ටිකෙන් ටික ජරාවට හා ව්‍යාධියට භාජනය උනෙ අනිත්‍යතා න්‍යාය අනුව උන්වහන්සෙගෙ භෞතික ස්වරූපය හැමතිස්සෙම වෙනස්වෙමින් තිබුණු නිසයි. ඒ උනත් සනාතන නිර්වාණ ධර්මය පාදක කරගත්ත බුද්ධත්වය ඒ කාලය තුළ කිසිම වෙනසකට භාජනය උනෙ නැහැ. ඒ බුද්ධත්වය ඇතිවෙන දෙයක්වත් නැතිවෙන දෙයක්වත් නොවෙයි. මතුවෙන දෙයක්. නිවන් දකල බුදුවෙච්ච බුදුකෙනෙකුන් අවුරුදු 45 ක් වැඩහිටියා කියල අප හිතාගෙන හිටියට. ඇත්ත වශයෙන්ම බුදුන් යනු නිවන් දහම බවයි යො ධම්මං පස්සති සො මං පස්සති කියල වක්කලි හිමියන්ට කරන ලද බුද්ධානුශාසනාවෙන් කියවෙන්නෙ. ඒ අනුව නිවන මූර්තිමත් වෙන බුද්ධත්වයක් මිසක බුද්ධ ආත්මයක් නැහැ. බුදු දහම අනාත්ම වාදයක්. නිවනක් තිබුණට නිවන් දකින ආත්මයක් නොහොත් පුද්ගලයකු නැත්තෙ ඒකයි. ඒ නිසා නිවන දැකිය හැක්කක් නොවෙයි.

♦ ***සම්මානිත මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම***
**Harrow UK**

## To reach my highest goal in life



Respect, I everyone dearly,
Responsibility, I take for my actions, accurately,
Equally, I treat my fellow man, similarly,
Aspirations, I follow, I see, so admirably,
Co-operation and communication, where needed,
I provide cordially,
Honesty, like no other, the most important deed,
I follow very truthfully,

Knowing, seeing, believing and practising
in the Greatest DHAMMA LORD BUDDHA
found and created,
With the very little Dhamma that I know and understand,
If I can follow and practice to become someday that LOTUS so grand,
You can too, listen to me, my dear friend !

♦ **Asoka Kumari Ariyasena - *Harrow UK***

**පුණ්ඩරීකං යථා වග්ගු**
**තෝයෙන නුපලිප්පති**
**නුපලිත්තෝ මි හි ලොකෙන**
**තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණාති**

***- ද්‍රෝණ සූත්‍රය - සංයුක්ත නිකාය***

*සිත් අලවන පිපුණු නෙළුම් මලක්*
*ජලයෙහි නොගැවී සිටින්නේ යම්සේද*
*මමත් මේ ලෝකයේ නොඇලී*
*වෙසෙන්නෙමි. එහෙයින් බ්‍රාහ්මණය මා*
*බුදුන් ලෙස අමතනු ලබන්නේය.*

As a Lotus fair and lovely,
By the water is not soiled,
By the world I am not soiled
Therefore, Brahmin, I am BUDDHA

Above is the reply given to the Brahamin Drona by Lord Buddha when the former asked the Buddha - “ Who are you exactly ? ”

**Drona Sutra in Samuktha Nikaya**

## ※ නව සහශ්‍රයට ධර්මානුශාසනා ※

### *හිතොපදේශයෙන්*

**මාතා පිතෘ කෘතාභ්‍යාසො - ගුණිතාමෙති බාලක:**
**න ගර්භච්‍යුති මාත්‍රෙණ - පුත්‍රො භවති පණ්ඩිත:**

***අර්ථය*** : *පුතා මවගේ ගැබෙන් බිහි වූ පමණින් උගතෙක් ගුණවතෙක් නොවේ. මව හා පියා විසින් කරන ලද අභ්‍යාසයෙන් ඔහු ගුණවත් බවට පැමිණේ.*

දෙමව්පියන්ගේ එකම සම්පත හෙවත් වස්තුව තම දූ පුතුන් ය. දූ දරුවනටද තමන්ගේ වටිනාම සම්පත ආදරණීය දෙමාපියන් ය. මේ දූදරු මාපිය සම්බන්ධතාව සනාතනික ධර්මයකි. එය මනුෂ්‍ය ප්‍රජාව අතර පමණක් නොව සෑම සත්ව කොට්ඨාශයකටම සාධාරණය වූ ධර්මතාවකි.

දෙමාපියන් විසින් තම දූදරුවන්ට කුඩා කාලයේ දක්වනු ලබන්නාවූ ආදරය, කරුණාව, දරු සෙනෙහස මෙන්ම පෝෂණය හා රැකවරණය නිසාම දරුවන් කායික හා මානසික සංවර්ධනයකින් යුතු සමාජයට වැඩදායක යහපත් පුරවැසියන් බවට පත්වන බව අපි දනිමු. නමුත් ඉන් ඔබ්බට ගිය තවත් පුළුල් කාර්‍යභාරයක් දෙමාපියන් තම දූ පුතුන් වෙනුවෙන් ඉටු කළ යුතුව පවතිනවා. ඒ තම දරුවන් සමාජ විරෝධී අපචාරී පුද්ගලයන් වශයෙන් නොව සමාජ හිතකාමී මිනිස් ගුණධර්ම වලින් අනූනවූ පුද්ගලයන් හැටියට තැනීමයි.

මෙම පද්‍යයේ සඳහන් ආකාරයට දරුවෙකු මව්කුසේ උපන් පමණින්ම ඔහු හෝ ඇය ගුණවත් නැණවත් කෙනෙකු වන්නේ නැත. ඒ සඳහා විශාල කාර්‍යභාරයක් දෙමාපියන් කළ යුතුව තිබේ. එනම් මව හෝ පියා විසින් එම දරුවන් අභ්‍යාසයෙන් හෙවත් පුහුණුවෙන් නිසි ආකාරයට හික්මවනු ලැබීමයි. නිසි ආකාරයට ගුණ ධර්මයන්හි පිහිටුවීමයි. එමෙන්ම අධ්‍යාපනයේ හා ශිල්ප ශාස්ත්‍රාදියෙහි ප්‍රගුණ කරවීමයි. එසේ නොමැතිව මව පියා කොතරම් ගුණ නැණ දෙකින් යුතු වූවත් ඉන් දරුවන්ට කිසිදු වැඩක් නොවේ.

දෙමාපියන් වැරදි මග යමින් දරුවන් නිවැරදි මග යැවීමට උපදෙස් දීම අද හැම සමාජයකම දක්නට ලැබෙන දෙයකි. දරුවන් ඇති දෙමාපියන් හැමවිටම දරුවන්ට ආදර්ශමත් ලෙස හැසිරිය යුතු ය. මක්නිසාද ළමා කාලයේ බොහෝ විට ළමයින්ගේ සිරිත අනුකරණය කිරීම වන බැවිනි. දරුවෝ විශේෂයෙන් ගෙදරදී තම දෙමාපියන් අනුකරණය කිරීමට නියත වශයෙන්ම පෙළඹෙන්නාහ.

දෙමාපියන් මත්පැන් පානය කිරීම, දුම්පානය, නිතර අඬදබර ඇතිකර ගැනීම ආදී නොයෙක් දේ තැන නොතැන නොබලා දරුවන් ඉදිරියේ ම කරමින් දරුවන් ඉන් වළකාලීමට ඔවුන්ට අවවාද අනුශාසනා කිරීම නිෂ්ඵල ය. '**ඔබා දෙනු පරහට තමා සම්මතයෙහි පිහිටා සිට**' යන කියමනට අනුව සෑම කෙනෙකුම අනුනට උපදෙස් දීමට පෙර තමා ඒවායින් වැළකී සිටිය යුතු ය.

අද හැමදෙනාම පාහේ ගත කරන්නේ කාර්‍ය බහුල ජීවිත ය. විශේෂයෙන් බටහිර රටවලට එය පොදු ය. නමුත් ඒ නිසාම දූදරුවන් ගැන නොතැකීම නුවණට හුරු නැත. අශ්වයා පැන ගියාට පසු ස්තාලය වසා වැඩක් ඇද්ද? දරුවන් නොමග ගියවිට දරුවන්ට හෝ සමාජයට දොස් පවරා තමන්ට නිර්දෝෂී විය නොහැකියි. එයට හේතුව ඉන් විශාල කොටසක් තමන්ට අයිති වන නිසයි.

එමෙන්ම යොවුන් වියට පිවිසෙන දරුවන්ද ඉතා කල්පනාකාරීව සමාජයේ ජීවත්විය යුතු ය. සමාජය හොඳින් වටහාගත යුතු ය. විශේෂයෙන් මිතුරන් ඇසුරු කිරීමේදී වඩාත් කල්පනාකාරී විය යුතු ය. හොඳ නරක දෙපැත්තටම ඉතා ඉක්මණින් පෙරළීමට ඇසුරු කරන් නන් බලපාන බැවිනි. අසත්පුරුෂ සේවනය කෙනෙකුගේ විනාශය ළඟාකර ගැනීමකි.

මේ නිසා දරුවන් ගැන දෙමව්පියන් වඩ වඩාත් සැලකිලිමත් විය යුතුවාක් මෙන්ම දරුවන් ද බුද්ධිමත්ව ක්‍රියා කිරීමෙන් තම ජීවිතය තමන්ට ද සමාජයට ද වැඩදායී ලෙසට සකස් කර ගත යුතු ය.

♦ ***රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති***
***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
***ලන්ඩන් බෞද්ධ විහාරය***
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**




**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**